සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය - 2021<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 01 යි<br>01 மணி நேரம்<br>01 Hour |
| පුරවැසි අධ්‍යාපනය I<br>குடியுரிமை கல்வி<br>Citizenship education I | 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 |

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

i. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

ii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01). ශ්‍රී ලංකාව ................................ රාජ්‍යයකි.
i. ඒකීය ii. සන්ධීය iii. වැඩවසම් iv. සංවර්ධිත

02). දේශපාලන සංවිධානයක් ලෙස ජාතික රාජ්‍ය යුරෝපයේ ස්ථාපිත වන්නේ,............................. සියවසින් පසුවය.
i. 17 වන ii. 15 වන iii. 20 වන iv.19 වන

03). ස්විස්ටර්ලන්තය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු................................ ලෙස හැඳින්වේ.
i. පළාත් සභා ii. කැන්ටන් iii. ප්‍රාන්ත iv. ප්‍රදේශ

04). නගර සභාවක ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ, ........................................
i. නාගරික ලේකම් ii. සභාපති iii. නගරාධිපති iv. උප සභාපති

05). පළාත් සභාවක් සඳහා පළාත් ආණ්ඩුකාරවරයෙකු පත් කරනු ලබන්නේ .................................. විසිනි.
i. අගමැති ii. ජනාධිපති iii කථානායක iv. හමුදාපති

06). මහ ජනතාවට වඩාත් ඵලදායී හා කඩිනම් සේවාවක් සැපයීමේ අරමුණින් පළාත් පාලන ආයතනවලට ..........................සංකල්පය හඳුන්වා දී ඇත.
i. කාර්යක්ෂමතා ii. සමානාත්මතා iii. යහපාලන iv. ගුණාත්මක

07). 2012 ජන සංගණන දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගම අදහන ප්‍රතිශතය ........................... ක් වේ.
i. 90.1% ii. 80% iii. 70.2 % iv. 20.5%

08). සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය ......................... වර්ෂයේ දී පැවැත්වූ සහශ්‍රක සංවර්ධන ඉලක්ක 08 ක් සම්මත කරගන්නා ලදී.

i. 2001 ii. 2000 iii 1999 iv 1995

09). සංස්කෘතිය යනු ඇදිහිලි, චින්තන ක්‍රම, ව්‍යවහාරික කලා, ජීවන පිළිවෙත්, සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා සමාජීය වශයෙන් ''සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි '' ලෙස හැඳින්වූයේ

i. චාර්ල්ස් ඒ. එල්වුඩ් iii ඒ.වී.ඩයිසි

ii. ඊ.ටී. හිලර් iv ටී.බී. ටයිලර්

10). සංවර්ධනය අනුව රටවල් බෙදා දැක්වීමේ දී ශ්‍රී ලංකාව අයත් වන්නේ.............................. රටවල් කාණ්ඩයටය.

i.පහළ ආදායම් ලබන iii ඉහළ ආදායම් ලබන

ii. මධ්‍ය ආදායම් ලබන iv . සාමාන්‍ය ආදායම් ලබන

11). මිනිසාගේ පැවැත්ම සඳහා අනිවාර්යයෙන්ම තිබිය යුතු දේ ............................. නමින් හැඳින්වේ.

i.ආශාවන් ii. අවශ්‍යතා iii.උවමනා iv අත්‍යවශ්‍ය

12). ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ............................ ධූරයක් නිර්මාණය කර තිබේ.

i.විධායක ජනාධිපති ii. අගමැති

iii.නාමික විධායක iv නගරාධිපති

13). ඒකීය ආණ්ඩු ක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණයකි.

i.ව්‍යවස්ථාදායකය මගින් විධායකය තේරීම.

ii. උත්තරීතර මන්ත්‍රණ සභාවක් පැවතීම.

iii.ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව සතුවීම.

iv ප්‍රාන්ත ආණ්ඩුවලට බලතල හිමිවීම.

14). සංක්‍රමණ ස්වරූපයෙන් පැමිණ ශ්‍රී ලංකාවේ ජනාවාස පිහිටුවන ලද අවස්ථාවක් වන්නේ,

i. ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම.

ii. කාලිංග මාඝ ආක්‍රමණය

iii.පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම.

iv අරාබි ජාතිකයින්ගේ පැමිණීම.

15). ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක වැදගත් ලක්ෂණයක් වන්නේ,

i. අධ්‍යාපන හා සෞඛ්‍ය පිළිබඳව පමණක් රජය අවධානය යොමු කිරීමය.

ii. පුරවැසියන්ගේ ජීවන තත්වයේ ගුණාත්මකභාවය ගැන නොසැලකීම ය.

iii.සමාජ සුභ සාධක කටයුතු කෙරෙහි විශේෂ අවධානයකින් කටයුතු කිරීමයි.

iv වැඩිහිටියන්ගේ රැකවරණය පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු නොකිරීමය.

16). බහු සංස්කෘතික සමාජයක යහපැවැත්මට බාධාකාරී වන ලක්ෂණයක් වන්නේ,

i.ජාති , ආගම් භේද නොසලකා කටයුතු කිරීමය.

ii. අන්‍ය ජාතීන්ගේ භාෂා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.

iii.අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමය.

iv සෑම විටම අන්‍ය සංස්කෘතීන්ට වඩා තම සංස්කෘතිය උසස් බව සලකා කටයුතු කිරීමය .

17). ................................ සමාජවාදී අර්ථ ක්‍රමයක් ලෙස පැවත වර්තමානයේ ක්‍රම ක්‍රමයෙන්
i. පෝලන්තය ii. සිංගප්පූරුව iii.දකුණු කොරියාව iv ජපානය

18). බලය විමධ්‍යගත කිරීමේ දී සිදුවන්නේ ආණ්ඩුවේ ................................ බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන වෙත පවරා දීම වේ.
i. විධායක ii. අධිකරණ iii.ප්‍රාදේශීය iv පරිපාලන

19). i.මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.
ii. පාඩු ලබන ආයතන පෞද්ගලීකරණය කිරීම.
iii.නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම.
iv අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම.

20). සමාජයේ සෙසු ජීවීන්ට හානියක් නොවන පරිදි තම සිතැගි ඉටුකර ගැනීම සඳහා බාහිර පරිසරයෙන් ලබෙන අනුග්‍රහය හඳුන්වන්නේ ................................... යනුවෙනි.
i. යුතුකම ii. වගකීම iii.නිදහස iv. අයතිය

21). ශ්‍රී ලංකාවේ බෙදා ඇති මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව වන්නේ,
i.24 කි . ii. 25 කි iii.21 කි. iv. 22 කි.

22). ජාතික රාජ්‍යයන් පිළිබඳ සංකල්පය ශක්තිමත් කළ දේශපාලන චින්තකයා මින් කවරෙක්ද?
i. ටී.එච්. ග්‍රීන්ය ii. ජී.මාෂල්ය
3. ජෝන් ඔස්ටින්ය iv. නිකොලොයි මැකියාවේලිය

23). ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සැලකිය හැකි රට වන්නේ,
i. ග්‍රීසිය යි ii. ජපානය
iii.ස්විස්ටර්ලන්තය යි. iv. මහා බ්‍රිතාන්‍යය යි.

24). රටක ව්‍යවස්ථාදායකට අයත් කාර්යක් නොවන්නේ,
i.නීති ක්‍රියාවට නැංවීම
ii. මුදල් පාලනයට සම්බන්ධ වීම.
iii.නීති සම්මත කිරීම
iv. විධායකය පාලනය කිරීමට මැදිහත් වීම.

25). ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බල පෑ භූගෝලීය සාධකයක් වන්නේ,
i.ත්‍රිකුණාමලයේ ස්වභාවික වරායක් පිහිටා තිබීමය.
ii. ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීමය.
iii.දකුණු ආසියාතික රටක් වීමය.
iv. සංචාරයකයන්ට යෝග්‍ය වෙරළ තීරයක් පිහිටා තිබීමය.

26). රාජ්‍යවල ප්‍රධාන ස්වරූප දෙක වන්නේ,
i.ජාතික හා ප්‍රාදේශීය රාජ්‍ය
ii. ඒකීය හා සන්ධීය රාජ්‍ය
iii.ඒකාධිපති හා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය
iv. ජනාධිපති හා පාර්ලිමේන්තු රාජ්‍ය

27). ශ්‍රී ලංකාවේ ජීවත් වන පුද්ගලයෙක් හට සර්ව ජන ඡන්ද බලය හිමි වන වයස් සීමාව වන්නේ,
i. අවුරුදු විසි දෙකයි ii. අවුරුදු පහළොවයි
iii.අවුරුදු විස්සයි iv. අවුරුදු දහඅටයි

28) බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකුගේ වගකීම වන්නේ,

i. තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීමය.

ii. විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම වැළැක්වීමට කටයුතු කිරීමය.

iii.සියලුම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැලකීමය.

iv. වැඩි පිරිසක් අයත්වන සංස්කෘතියට අනුගතව කටයුතු කිරීමය.

29). ආර්ථිකයක පවත්නා සම්පත් මිනිස් වුවමනා ඉටු කරගත හැකි ආකාරයට වෙනස් කිරීම හඳුන්වනුයේ ,

i. නිෂ්පාදනය　　ii. පරිභෝජනය

iii. බෙදා හැරීම　　iv. එකලස් කිරීම.

30). රටක විවිධ ජාතීන් ජීවත් වුවද ඔවුන් එක් ජාතියක් ලෙස සැලකිය යුතුය යන අදහසින් බිහි වූ දේශපාලන සංකල්පය වන්නේ,

i. ගෝලීයකරණයයි　　ii. මානව වාදයයි

iii.ජාතික රාජ්‍යයයි　　iv.ලිබරල් වාදයයි.

31). ශ්‍රී ලංකාව තුළ ප්‍රාදේශයී මණ්ඩල හා ග්‍රාමෝදය මණ්ඩල ක්‍රියාත්මක කිරීමට පටන් ගැණුනේ කවර වර්ෂයේ දීද ?

i. 1978　　ii. 1987　　iii.1981　　iv. 1990

32). ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත සතු බලතල යටතට අයත් නොවන්නේ,

i. සෞඛ්‍යය　　ii. නිවාස ඉදිකිරීම

iii. බදු පැනවීම　　iv. අධ්‍යාපනය

33). සමාජවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ,

i.තරඟකාරී වෙළඳ පොළක් පැවතීම.

ii. මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේදී පොදු යහපත උදෙසා කටයුතු කිරීම.

iii.පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසාය යන අංශ දෙකම දක්නට ලැබීම.

iv. ආදායම් අසමාන ලෙස බෙදී යාම.

34). ක්‍රි.ව. 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවති ඉඩම් භුක්තිය හා බැදුණු සේවාවන් සැපයීම මත පදනම් වූ කෘෂි ආර්ථික රටාව හැඳින්වූයේ,

i.සමාජවාදී ක්‍රමය යනුවෙනි.

ii. වැඩවසම් ක්‍රමය යනුවෙනි.

iii.වෙළඳපොල ක්‍රමය යනුවෙනි.

iv. ධනවාදී ක්‍රමය යනුවෙනි.

35). රටක යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ඉටු කරනු ලබන්නේ,

i. ජන මාධ්‍යයයි　　ii. අධිකරණය යි　　iii.පාර්මේන්තුවයි　　iv. විධායකය යි.

36). යුරෝපයේ පුද්ගල නිදහස ඇගයීමට ලක්වූයේ,

i. ධනේෂ්වර චින්තනය නිසාය.

ii. සමාජවාදී අදහස් නිසා

iii.වැඩ වසම් සමාජ ක්‍රමය නිසා

iv.ලිබරල්වාදී අදහස් නිසා

37). පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට යොමු කිරීමේදී වැදගත් කාර්ය භාරයක් කළ හැකි වන්නේ,

i. අමාත්‍යාංශ ලේකම්වරුන්ට ii. මානව හිමිකම් පනතට

iii.නිදහස් ජන මාධ්‍යයන්ට iv. රාජ්‍ය සේවකයන්ට

38). බ්‍රිතාන්‍ය පාලන සමයේ ප්‍රථම වරට ස්ථාපනය කරන ලද මහ නගර සභා වන්නේ,

i.කොළඹ, ගාල්ල ii. කොළඹ , මහනුවර

iii.කොළඹ , ගම්පහ iv. කොළඹ, කළුතර

- පහත ප්‍රකාශන කියවා 39,40 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A. පළාත් අයවැය ලේඛනය සැකසීම.
B. පළාත් සභා ප්‍රඥප්තිය අනුමත කිරීම.
C. පළාතේ ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කිරීම.
D. පළාත් සභාව ඇමතීම හා සන්දේශ යැවීම.
E. පළාත් සභාව කැඳවීම වාර අවසන් කිරීම හා විසුරුවා හැරීම.
F. පළාතේ පරිපාලන සැලසමු සකස් කිරීම.

39). පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු බලතල අඩංගු පිළිතුර තෝරන්න.

i. A B F ii. D C F iii. A B C iv. B D E

40). පළාත් සභාවක මහ ඇමතිවරයා සතු බලතල අඩංගු පිළිතුර තෝරන්න.

i. D E F ii. C E F iii. AC F iv. B D E

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය - 2021<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 02 යි<br>02 மணி நேரம்<br>02 Hours |
| පුරවැසි අධ්‍යාපනය II<br>குடியுரிமை கல்வி II<br>Citizenship education II | 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 |

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න (පිළිතුරු සැපියයුතු මුළු ප්‍රශ්න පහකි).

- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

01). 1. ජාතික රාජ්‍ය බිහි වීමට බල පෑ හේතු දෙකක් ලියන්න.
2. බලයේ විවිධ ස්වරූප 02 ක් නම් කරන්න.
3. පළාත් සභා සඳහා බලය බෙදා ඇති ලැයිස්තු 03 මොනවාද?
4. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 2 ක් ලියන්න.
5. ජන සමාජයේ ඇති සියලුම බලවේග මෙහෙයවන සංස්කෘතික ලක්ෂණ 2 ක් ලියන්න.
6. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න.
7. පුරුවැසියෙකු සතු යුතුකම් වර්ග 2 නම් කරන්න.
8. උත්කෘෂ්ඨ විප්ලවය ලෙස හැඳින්වෙන්නේ කුමන විප්ලවය ද ?
9. හිඟකම තුළින් පැන නගින මූලික ආර්ථික ප්‍රශ්න 2 ක් ලියන්න.
10. නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම 2 ලියන්න.

(ලකුණු 2=10 20*

02). I ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක සඳහන් කරන්න. (ලකුණු 02 )

II. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
III. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03). I. අර්ථ ක්‍රමයක් යනු කුමක්ද? (ලකුණු 02)
II. අර්ථ ක්‍රම ප්‍රධාන කොටස් 3 කි. ඒ මොනවාද? (ලකුණු 03)
III. මිශ්‍ර අර්ථ ක්‍රමයක දැකිය හැකි ලක්ෂණ 5 ක් ලියන්න. (ලකුණු 05)

04). I. ආණ්ඩුවක් යනු කුමක්ද? (ලකුණු 02)
II. ආණ්ඩුවක් සමන්විත ප්‍රධාන ආයතන නම් කරන්න. (ලකුණු 03)
III. ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ කෙටියෙන් ලියා දක්වන්න.
(ලකුණු 05)

05). I. යහපාලනයක මූලික ගුණාංග දෙකක් සඳහන් කරන්න . (ලකුණු 02)

II. බහු සංස්කෘතික ජන සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන් උදාකරගත හැකි යහපත් ප්‍රතිඵල 3 ක් ලියන්න. (ලකුණු 03)

III. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග තුනක් විස්තර කරන්න. (ලකුණු 05)

06). I. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. අනාගත පුරවැසියෙකු වශයෙන් ඔබෙන් රටට ඉටුවිය යුතු යුතුකම් 3 ක් ලියන්න. (ලකුණු 03)

III. පවුලේ සාමාජිකයෙකු වශයෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් 3 ක් ලියා ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

07). I. ලෝකයේ බහු සංස්කෘතික සමාජ පවතින රටවල් 2 ක් ලියන්න. (ලකුණු 02)

II. බහු සංස්කෘතික සමාජයක් බිහි වීම කෙරෙහි බලපාන සාධක 03 ක් ලියන්න. (ලකුණු 03)

III. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

08). I. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා නිෂ්පාදන සාධක 2 ක් නම් කරන්න. (ලකුණු 02)

II. අන්තර් භාණ්ඩ යනු මොනවාදැයි නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 03)

III. භාණ්ඩ හෝ සේවා කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද? යනුවෙන් උද්ගත වන මූලික ආර්ථික ප්‍රශ්නය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)